
# සංධ්වනි

## කෙටි කතා සංග්‍රහය



නුවිනි හෙසාරා බටුකුමාර

# සංධ්වනි

## කෙටිකතා සංග්‍රහය

පළමු මුද්‍රණය - 2025.02.08

ISBN 97862493848

නුවිනි හෙසාරා බටුකුමාර

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍ර[illegible] 2025.02.08 [illegible] අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## කතෘගෙන්

මාගේ කුළුදුල් කෙටිකතා සංග්‍රහය වන 'සංධ්වනි' නම් ප්‍රකාශනය මනඃකල්පිත කතා ගොනුවක් වන අතර මෙයින් පාඨක සිත්හි යම් අදහසක් රඳවන්නට වෑයම් කළෙමි.

මෙම නිර්මාණය ආරම්භ කළ දා පටන් නිතැතින්ම මා දිරිමත් කළ ආදරණීය අම්මාත්, තාත්තාත් නංගීත් මාගේ හොඳම මිතුරාත් මෙන්ම පොතක් ලියන්නැයි උනන්දු කළ සිරිමාන්න ගුරුතුමියත් ඊට කැපවෙමින් මඟ විවර කළ මාලනී ගුරුතුමියත් අ' යන්නේ පටන් සාහිත්‍යය පිළිබඳ මනා දැනුමක් ලබා දුන් පුෂ්පා ගුරුතුමියත් මයුරි ගුරුතුමියත් ඇතුළු බ/සීවලී මහා විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයත් මා හට ශිල්ප ලබා දුන් සියලුම ගුරු මව්වරුන්, ගුරු පියවරුන්ද නන් අයුරින් සහයෝගය දැක්වූ සහෝදර සහෝදරියන් සහ බණ්ඩාරවෙල මහ නගර සභා පුස්තකාලයේ කාර්ය මණ්ඩලයත් ඉතා ගෞරවාදරයෙන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

මෙම නිර්මාණයේ හිමිකම් කර්තෘ සතුවන අතර මෙහි එන කිසිවක් අනවසරයෙන් උපුටා ගැනීම අනුමත නොකරමි.

මීට
නුවිනි හෙසාරා බටුකුමාර
නො : 272,
ඉහල කහත්තේවෙල,
බණ්ඩාරවෙල


## පිදුම

නිතැතින්ම මා අගය කරමින්
වැරදි හැර නිසි මගේ හොවමින්
අවංක හදවත්වලින් මා හට
අත්පොළසන් දුන්
මාගේ දියුණුවම පැතූ
සියලුම දෙනාට
ඉතා ගෞරවාදරයෙන්
තිළිණ කරමි.

# හැඳින්වීම

තත්වලින් තනු වලින්
සංගීතයද සියුම්ව
නාද රටාවක ධ්වනිය
අඩු - වැඩි - උච්ච තල
රිද්මයින් රිද්මයට
හුවමාරුවක
කලාත්මක සංධ්වනියකි

මටද කෙටි කතාවක්
අකුරු වචන ඡේද පිටු තුළින්
පාඨක ඔබේ හදට
ලියූ පරිච්ඡේදයක් සමඟ
මෙනම් සංධිවනියද....



... සං

## පටුන

1. සුදුරෝස .........
2. උඩරට බෙරහඬ .........
3. මන්තරය .........
4. දේදුන්නක් .........

## 01. සුදු රෝස

කොලොම්පුරේ උපන් පොහොට්ටුවක් නුවරින් විකසිත වී සුවද තබා දිලුණා ය. මේ සුදු රෝස කුසුම කරළිය හැඩ කළේ පැහැයෙන්ම නොවේ. පැහැය තුළ වන් සුවඳැති චමත්කාරය කැටි කර කරළියේ රඟමින්ය. වීදි බඹරු වටකර රැඟූමුත් බඹරුන්ට මේ කුසුම රැකි අකුල ඉඩක් නොතැබිය. ඒ තරම්ම කටු උල්ය ; තියුණුය ; ආරක්ෂිතය. සුදු රෝස මල් යායක් එක පොකුරට රැකගන්නට කටු වදුලම මහඟු රැකවරණයක් ලබා දුන්නේ ය. ඉදින් කටු අකුලක වූව ද සුවඳ විහිද නැලවෙන්නට ශක්තිමත් නටුවක් පන්නරය දෙමින් රෝස කුසුම් අහස දක්වා විහිදා පෙන්වී ය.

“කොළඹ නම් නොවේ දරුවෝ, මේ හොස්ටල් එක.”

සඳරේඛා මෙසේ කීවේ තාරුකා පාසලට ඇතුලත්ව නේවාසිකාගාරයට ආ පළමු දිනමය. තාරුකා පසළොස් විය තෙක්ම එදා පටන් හැදී වැඩුනේ නුවර

නේවාසිකාගාරයක ය. නේවාසිකාගාරය ද මහත් තෝතැන්නකි. සිසුවියෝ හැත්තෑවක් පමණ එහි නේවාසිකව උන්හ. නේවාසිකාගාරය පිහිටියේ රූස්ස කැලයකට යාබදව ය. මෙහි එලින් මලින් ගැවසි තුරුලතාවෝ අරක්ගෙනය. කළු ගලින් බැඳි උස් බිත්ති වට දිව ගිය සුදු රෝසමල් වැල් කළු වණින් බැබලෙන ගල් බිත්තිවලට තේජසක් එක්කොට හමාරය. අරක් ගත් එකදු මලකට හෝ අතක් තබන්නට නේවාසිකාගාරය නීතියෙන් තහනම්ය. හැඩට පිපෙන මල් වැල් දෙස ඉහළ සිට බලා ඉන්නට තාරුකා ප්‍රිය කළාය. සඳරේඛා ප්‍රිය කළේ මෙහි වෑහෙන සමබර සුගන්ධයට ය. ඕ ජනේලය පවා විවර කරන්නේ වෑහෙන සුවද කුටියට එක් කර රැස්කර ගැනීමට වුවත් සුවඳත් විඳීමට ය.

හැම දිනකම පාහේ නේවාසිකාගාරය දොරකඩ පාමුල ඇති පඩිපෙල් පේළියේ සවස් යාමයත් ගොම්මනත් යා කරන සඳරේඛාගේ සමය නිස්කලංකව ගෙවී යන්නේ මල්වැල් ගෙතී ගිය ආරුක්කුවට ඉහළින් අහසට වඩිනා

තරුවක් දෙස බලා හිඳීමෙනි.

“පුළුවන්ද සඳරේඛා කාවදාහරි බබලන්න.”

ඇගේ ගුරු හෘදාභ්‍යන්තරයෙන් නැගගෙන එන ගැටලුව එයයි. නමුත් ඇය නිහඬියාව පිළිතුරු කළාය. අද ඒ තාරකාව අහසට ගොඩවෙද්දීම තමා සිටි තැනට ගොඩ වුයේ තාරුකා ය. තාරුකා දුටුවන සඳරේඛා නිහැඬියාව බින්දා ය.

“තාරුකා දන්නවාද අර ලස්සන තරුව ?.”

“ඒක හරි ලස්සනයිනේ මිස් ...”

“ඔව් ළමයෝ , හැමදාම ඒක පායනකම් මං මෙතන.”

“හැමදාම ?.”

“මං බබලන්නම්.....” මුවින් නොකියා සිතින් කී වචන දෙක ගුරු හදවතේ කොනකින් රැඳුනි. සඳරේඛා

එසේ වෙත්ම තාරුකා මනසේ සටහන් තැබුවේ "මමත් බැබලෙනවාමයි" කියාය.

තව දිනක් උදාවිය. සූර්යාගේ වැඩම කිරීමට මත්තෙන්ම සුදු රෝස අතු බරට පිපි තිබුණි. දස සුවඳ ඉතිරි කර හරි හැඩට රටා තියා ඇත. කුරුලු කූජන ගීතාවලිය ශේෂව ගියෙන් ගොම්මන් අඳුරටත් විකාශය කරන්නට සොබාදම ප්‍රයත්නයක් දැරීය. නීලවලා ගැබ රෝස සලු හැඳ කාල වර්ණය ඩැහැගද්දි කළු අඳුර මැද තරුව සුදවනින් දිලුණේ ය. සැගවුනත් ඉර එළිය නිලොභවම තරුවකට තිළිණ විය.

කෙලිලොල් තාරුකා කළ සරදම් මිතුරු දෙනෙත් රත්පැහැ ගන් වූවත් ඇගේ විහිළු කවට කතා හා රැදුණු රංගනයන් තත්පරයකදී ඕනෑම පිරිසක් සිනහවෙන් මුසපත් කළා ය. රංගනයෙන් තාරුකා ලද්දේ ඉමහත් කීර්තියකි. ඈ පැළඳි කිතුගොසවිත් කරළියේ ඔටුනු පලන් යොවුන් නිළියකව වේදිකාවල මතුවෙද්දි ජීවිතයේ ඕ රැඟූ ඇතැම් චරිත හදවතින්ම අව්‍යාජ ය. නමුත් කරළියේ ව්‍යාජත්වය තුළ ඈ

තාත්විකය. හදවතට සියලු අංගවලින් අභිනයන්ගෙන් පරිපූර්ණව සමීප කරවීමෙහිලා ඕ සහජ හැකියා ලැබුවා ය. මේ රංගන හැකියාව අල්ලා ඔපමට්ටම් කළේ සඳරේඛා ය. ඇප කැප වූ සඳරේඛා තරුණ ගුරුවරියක වූවද තමා නොලත් බොහෝ අවස්ථා තාරුකාට නිතැතින්ම දායාද කළා ය. තාරුකාගේ හෙට දවසේ සුබ විහරණයම පැතූ සඳරේඛා තුළ වූ කරුණා බරිත ගුරු ගීතයේ මියුරු ස්වරය තාරුකාගේ හිස්තැනක්ව තිබූ මාතෘ ස්නේහයට පිළිතුරක්ව මුළු දිවියම සංගීතවත් කළේ ය.

කෙසේ වෙතත් තාරුකා රැඟුමට නම් කැමති ය. වේදිකාවේ නටන්නට, ගයන්නට පමණක් නොව හඬන්නට කෑගසන්නට සිය චතුරත්වයෙන් දෙබස් කියන්නට ස්වෝත්සහයෙන්ම අභිනයන් නිරූපණයට මෙන්ම ප්‍රේක්ෂක හදවත්වලට ඉරියව්වකින් වූවද තට්ටු කරන්නට ඇයට පන්නරයක් වූ සඳරේඛා පිපිපෙන කුසුමකට ශක්තිමත් නටුවකි. වේදිකා නාට්‍යක රැජිනගේ ප්‍රධාන චරිතයට වරම් ලැබූ තාරුකා සතුටින්

ඉපිල ගියාය. සුදු රෝස යායක් ඇගේ ඉහේ පිපුණි. හවස දිව ගොසින් සඳරේඛාට කියද්දි තාරකාව අලංකාර කර තිබුණේ නිලට නිල් අහස් ගව්ව ය. ඒ තරුව දිලිසෙද්දී සඳරේඛා තෘප්තිමත් වූවා ය.

" ප්‍රධාන චරිතේ..... ඔටුන්නක් දාමු නේද ?. "

" බයයි මිස් "

"මගේ කෙල්ලට වරදින්නෑ... තාරුකා "

කාලවේලා පිළිබඳ දෛනිකව යම් සටහනක් ලියා යා යුතු පොතක් නේවාසිකාගාරයේ වෙයි. හවස එන වේලාව එහි ලියවිය යුතුය. තාරුකා තම නාට්‍ය පුහුණු වීම්වලට ගිය පළමු දිනයේ පැමිණියේ රෑ අටට පමණ ය. නාට්‍ය පුහුණුවන ශාලාවද එතරම් ඈතක නුවූයෙන් යන්න එන්න ඇයට නිදහසේ වරම හිමි විය. තාරුකා එන තුරු මඟ රැකි සඳරේඛා ඒ වේලාවේ අහස දෙස බලා ඉඳින්නී ය. එදත් තරුව අහසටවිත් තිබුණි. සඳරේඛාගේ කනට වැකෙන තාරුකාගේ වාග් මාලවම ඒ අතර තුර ඇය ශ්‍රවණයට නතු කර ගන්නීය. කුරුලු කූජනය නම් අද මදක් පමා වී තිබුණි. පමාව ආ තාරුකා

සඳරේඛාගේ මුහුණවත් නොබලා නේවාසිකාගාරයට ගියා ය. තාරුකාටත් විඩාබර ඇතැයි සිතූ සඳරේඛා නිහඬ වූවා ය.

දෙවන දින උදයේ නේවාසිකාගාරයේ සුදු රෝස මල් අතර බඹර සෙවණැලි කැරකෙමින් තිබුණි. දෙඹරයක් ඇවිස්සී ඇතැයි කියා ප්‍රවේශම් වන්නට සිසුවියන් ඉක්මන් වූහ. සුදු රෝස අතර හුන් කටු අතරින් රිංගා යන්න නොදත් සීරුණු බඹර තටු එහිම බිම වැටී තිබුණි.

''ඉස්සරහට මීට වඩා පරක්කු වෙයි මිස්, අනිද්දාට නාට්‍යය නේ... ''

කියා නික්ම ගිය තාරුකා නාට්‍ය අපූරු අන්දමට පුහුණු වන්නට කාලය මිඩංගු කළා ය. සඳරේඛා ඈ එන තුරු දෙවන දින රෑ අටයි තිහේ කණිසම ද පහුව නවය කණිසම ද පසුකරමින් රැය පහන් කලාය. දහයේ කණිසමට විනාඩි දෙකක් තියා මඟට බැසු සඳරේඛාට ගතව ගිය නිමේෂයේ දී දුටු

තාරුකාගේ රුව පසුපස වූ සෙවණැලි දෙකින් එකක් ක්ෂණයෙන් අතුරුදාන් වූයේ ඇහිපිල්ලමක් ගසන පමාවටයි. කොළ අත්තක් වෙන්න ඇති කියා සඳරේඛා තම සලිත සිත් දිය  නිසල කර ගනිමින් සැනසුම් සුසුමක් හෙළා තාරුකාවද කැටුව ඇයත් සමඟ නේවාසිකාගාරයට ගියා ය. මුනිවත රැකි සඳරේඛා හදේ ශෝකයත්, බියත් සුසංයෝගව කැකෑරුණු ආවේගය අනුකම්පා බරිතව උඩු සුළඟට විසිකළා ය.

සුදුරෝස මල් සැරසි තෙවන දිනය ද හිමිදිරියේ රොන් මත බඹරුන් නැටූ ගුමු ගුමුවක් නද කරමින් තිබුණි. මල් මකරන්දයට හා නැගූ සෙවණැලි උමතුව එක්ව තාරුකාගේ සිත් ගැබ අරක්ගන්නට මාන බලමින් ය. සුවදත් ශෝභාවත් හරහට හිටි මේ මල්දම් ඇගේ සිතට කා වැදුණාහ.

සවස එළඹෙත්ම සඳරේඛා තරුව හෙව්වේ පුරුද්දට ය. අමාවකේ අහසේ පාලුවක් වූයේ සඳ සැඟව යෑමක් වූවත් අමාවකේත් බැබලුණු තරුව අද අහසේ නොවීම ගැන සඳරේඛා කුතුහලෙන්ය. නෙතු යුවල

විපරම් කරද්දි අඳුර මැද්දෙන් ඇසුණු රෑ දහයේ කණිසම ඇයට මඟට බැස යන්නට අවවාද නියම කළේ ය. නික්මුණු ඇය පෙර දින තාරුකා හමුවුණු තැන පසුකර මගේ ඉදිරියට යද්දි ඇගේ සේයාවක් නෙතට නොගැටුණි. ආලෝක කුලුණක් යට බංකුවක් මත ඉඳගත් තාරුකා එයි දැයි ඇඟිලි ගණින සඳරේඛා සොයා ආවේ ධාරාණිපාත මහ වරුසාවක් පමණි.

ගිනි පුපුරණ අකුණු සමඟ හෙණ හඬ දී ආ ගෙරවුම් බියෙන් ධ්වනස්ත මනස්චිතය කබලින් ළිපට ඇද දැම්මේ මවකගේ ලතෙත් හදවතකට වන් ගුරු හදින් නැගී දරු දුක නොදත් සොබාදහමේ ඵලයක් ලෙසය. මහමේඝය මුළු නුවරම යට කරමින් වීපී පුරා ගලා ගිය ජල කදක් වෙද්දී දරු දුකින් නැහැවුණු සඳරේඛාගේ හදවතින් ජනිත ගිණිකද මේ දියකදට නිවන්නට බැරි විය. නමුත් සිසිලාකර හෙල්මැලි රුව කුඩයක්ද අතැතිව වැස්ස මැද මග කෙළවරකින් මතු වෙද්දි කරුණාවෙන් දෝර ගැලූ සතුටු කඳුලු පෙර දැරිව මොවුහු නේවාසිකාගාරයට පියමැන්නේ දෙගොඩ

හරියේ ය.

කැමරා ආලෝක පහන් විශාල වේදිකාව ප්‍රේක්ෂකාගාරය උපහාසයෙන් බලන් උන්නේ ය. වේදිකාවට නැග ඔටුන්නද හිස පැළඳ දෙව්ලියකවන් රෝස කුසුම නිර්භයව අභියෝගය බාරගත්තා ය. බියෙන් එදා ගැහුණු දෙනයන අද ආලෝක පහන් වලටත් වඩා ආලෝකමත් විය. එදා වෙව්ලී ගිය දෙතොල් අද හඬ නගද්දී ප්‍රේක්ෂකාගාරයම නිහඬ විය. ඇගේ අභිනව ශිල්පීය දක්ෂතා පිළිබිඹු කරන විට කැමරා කාව ග්‍රහණයට එක් කරගෙනය. අවසානයේ වේදිකාව ඒ ප්‍රාසාංගික රූපාවලෝකනයෙන් දෙදුරුම් කද්දී ඕල්වරසන් දෙද්දී සඳරේඛා තුටු කඳුළු වැගිරුවා ය.

ඒ සන්තුට්ඨියට වූ ආයුක්මය අල්ප මාත්‍ර කාලයකට සීමාව සුදු රෝස මල පලන් රජ කිරුළ බිම වැටුණි. හැමදාම පායන්න විත් තරුව නොකියාම සැගවීය. එදා කරලිය සුදු රෝස කුසුමක ව්‍යාජ තාත්වීය බව අද ජීවිතයේ ව්‍යාජත්වය අභිබවා ගොස් බඹර

සෙවණැලි යට පරව කටු අකුලේ රැකවරණ සිද මිලිනව ගියේය. එතැන් උපන් රතු රෝස පඳුරක රතු රෝස මලක් පිණි දරා විකසිත විය.



## 02. උඩරට බෙරහඬ

විසල් රුස්ස ගස් මැද්දෙන් හමන පවන සිහිල්මුත් තේ දල්ල වැනෙන්ට වැනෙන්ට අල්ලන්න දරන දෑඟිලි වලටත් වඩා සිත් දැහැනට විඩාබරය. දිවිගමන පණ ගහන්නට නම් මේ විසල් රුස්ස ගස් අතුරෙන් ගොස් නෙලනා තේ දල්ල ප්‍රමාණවත් විය යුතුය. තේ දලු නෙළීම වෘත්තීය කොටගත් ලැයිමේ වු එක් සිහල කෙල්ලක්ද සොළොස්විය වෙද්දීත් මේ රටානුගත පැවැත්මට නුහුරු නොවූයෙන් අත්තම්මෙක්ගෙත් ඇගේත් කුසට යමක් වැටුණෙන් කටු අත්ත මල් ඉත්තක් කරන්නට ගලා යන කාලය ඉඩ හසර වෙන් කර තිබුණී

ඈ විෂයය තුළත් බැහැරත් දිදුලන සිසුවියක් වූවත් ලැයිමේ මිනිසුන්ගේ පදය නම් '' සිහල එකියකට ඔච්චර දේවල් මොකටද, අපේ උන් කොහෙටද'' කියායි. දමිළ ජනයන් මැද වැඩීමට සිංහ ලේ අපොහොසත් වූවත් ජාත්‍යාලය පසෙකලා සංහිඳියාව ඉස්මුදුනට ගෙන මහන්තත්තකමේ අභියසදීත්

ගෙන්දගම් පොළොවේ පය ගසා ජීවත් වන්නට ඇයට හැකි වුයේ උපන්දා සිටය. සොබාදමින් ආශිර්වාද ලද්දා වූ මෑ බාධා මධ්‍යයේත් ජයග්‍රහණ මධ්‍යයේත් නොසැලෙන පහන් ටැඹකි. ඈ නමින් සේනාරී නාදිත්‍යා නම් වූවාය.

එක්තරා උදෑසනක පාසල කරා වැටුණු ගුරු පාරේ ගමන් කරමින් හුන් සේනාරිට මීදුම් සුදු හැඳි කඳුපන්ති උඩින්, ගංගා ඇළදොළ ගස් මල් කොළ රිදියෙන් බබලවමින් හිරු එළියක් නැගවිත් තිබෙන සැටි දිස් විය. දුරදී වූවත් නිල් අහසක විචිත්‍රත්වය හා පොළොවත් සොබාදහමත් ගළපන්නට මේ මනස්කෘත දර්ශනය සමත්විය. ගුරුපාරේ ඉදිරියට පිය මනින ඇගේ නෙතට රවිශංකාගේ රූපයේ ඡායාව ගැටෙන්නට වැඩි වේලාවක් ගියේ නැත.

'' බලන්න ඉරත් එක්ක මේ ගස් වල තියෙන හැඩ අද''

'' ඔව් ටීච, මල් ටිකත් ලස්සනට පිපිලා''

නමින් මෙන්ම ගුණයෙන්ද රවිශංකා උසස් ය. නර්ථනාචාරිණියක් වූ ඇය හැකි උපරිමයෙන් තම ගෝලයන්ට ශිල්පය දී ජාතික තලය ඔවුන් හට භාර කරයි. ස්ථාන මාරුවක් ලබා පැමිණි ඇයට හමුවූ හොඳම ශිෂ්‍යාව වන්නට සේනාරිට හැකි විය.

සේනාරි කිසිදා නැටුවේ නැත. වන්නමක පද පේළි ඇගේ හිතේ නොවූ තරම් ය. උඩරට දහ අට වන්නමේ තාල පද නම් අකුරක් නෑර ඇගේ හිතේ වූයෙන් උඩරට බෙර ඇසමත රඟන දෑත් නැටවෙනයුරු බලා සිටීමට නෙත්කලුය. ගැටබෙරය වූ මෙයත් සමඟම බැඳි අපූර්ව සාංසාරික බැඳීමක් සේනාරී සතුවැත.

සම්ප්‍රදායේ සම්මත වූ කලී බෙරගසන බොහෝ දෙනෙකු පුරුෂ පක්ෂයයි. ලැයිමේ ජන බලකායටත් එය එසේම විය. මේ හේතූන් මත රවිශංකාට කිසිවෙකුගේ ඇසට නොගැටෙන සේ කනට නොවැකෙන සේ තමා දත් ශිල්පය සේනාරිට නිර්ලෝභීව පරිත්‍යාග කරන්නට වීර්යයක් හා

උනන්දුවක් තිබුණි. එම ගුරු භූමිකාවේදී මවක මෙන් සේනාරි රැක ගන්නටත් ඇය නිර්භය විය.

පුහුණු වීමේ කාලය ගතව යද්දී මුලික අඩිතාලම වැටුණු පසු ගොඩනඟාගත් අනන්‍යතාවයට කැටි වූ හැකියාවකින් උපන් දක්ෂතාවය හරහා යා හැකි මඟ ඉතා දිගුමුත් විදුහල්පති දැනුම් දුන් හිදිසි පණිවිඩයකින් රවිශංකා තැතිගත්වනය.

''හෙට කලාප නැටුම් තරඟ''

පමාවී පැමිණි පණිවිඩයෙන් සිහියත් අවසිහියත් අතර දෝලනයෙන් පසු මුවින් පිටවූ වදන් පෙළෝ අකුරු අතර හිස්තැන් ය. තමාට සේනාරිට කැපකිරීම් නොකළා නොවේ ද? ඇ ශිල්පියෙකු තෙක් වැඩුවා නොවේද? තමා ඇ හට නුදුන් ශිල්පයක් ඇත්ද? එසේ නම් මෙතෙක් තමා සරණ කොටගත් ඇයට තමාට සරණක් කොටගන්නට නොහැකි නොවේ. ඔව් මෙම ප්‍රශ්නාර්ථයට එකම විසඳුම ඇයයි. සේනාරි නාදිත්‍යා ........

''පුතේ , හෙට තරඟ''

'' අපි මොකද කරන්නේ ටීච, පරදින්න බෑ''

''ඔව් පුතේ''

''කාලෙ මදිනේ ටීච''

''නෑ, දරුවෝ තනියෙම හරි බෙර ගහමු''

අසළ වූ තණ නිල්ලේ ළපලු ගහක දළඹුවෙකි. දළඹුවා බිත්තරෙන් එළියට ආවෙත් මේ පරිසරයේම ය. ඌ තමා කවුදැයි දැන හැඳින වර්ණය වැදගත් නොකරමින් තමා කැමති පරිදි ළපලු මත විසුවේය. අවැසි විට ළා දළුද අහරට ගත් ඌ මත කලකින් කෝෂයක් බඳින්නට පටන් ගත්තේ ය. කෝෂය තුළට වත්ම පිටත පරිසරයක් වෙනකෙකු බලා සිටීමත් ඌට වැදගත් නොවේ. වෙහෙසුනේ සමනලයෙකු වීමේ අභිප්‍රාය සාක්ෂාත් කිරීමට ය.

සුළඟ හැමුවේ ය. ගස්වැල් අඹරා ආ සුළඟ පිනි

වැස්සක් විය. පින්න වැස්සක් විය. තෙම් තෙමී ආ වැස්ස අසෙනියක් වී නොනැවතුනි. අනෝරා වැස්සෙන් ගැලූ ජල කඳට ළපලු ගහත් හෙම්බත් කර ඇත චණ්ඩ කුණාටුවක් වූ මෙය ගං දැලවල උතුරා යවා තිබේ ඉවසාලිය නොහැකි සේ සොබාදහම කම්පිතය. අචංචලය. නිවී සැනහී උන් හිරු කිරණට වරින් වර එබී බලා සැහෙන්නට අමතක නොවීය.

දවස පැමිණියේ ය. මේ ජාතික තලයයි. සැඩ කුණාටු මැදින් ගුරු සිසු දෙපළ ජාතික තලයටවිත් හමාර ය. තරඟකාරීත්වයෙන් හෙබි සමස්ත ලංකා තරඟාවලිය ධාවන තරගයක් බඳු විය.

''සේනාරි, දිනන්ට තැතත් කමක් නෑ පුතේ, කරන දේ හරියට කරන්න ''

''දළදා හාමුදුරුවන්ගේ පිහිටයි දරුවෝ ''

ගුරු පා බැඳ බෙරයද ගෙන වේදිකාවට ගොඩවූ සේනාරි දෙස බලා සිටින රවිශංකා ගුරුවරියව දක්නට ලැබුයෙන් ඒ දෙනෙත් හා බැඳි සබැඳුමත් සමඟ

ආත්ම විශ්වාසය තීව්‍ර විය. රවිශංකා ගුරුවරියගේ සිත දල්වා තිබූ පහනක දැල්ල සුළඟට සෙළවෙන්නාක් මෙන් චකිතය හා බියේ සට්ටනය විය. සෝනාරිගේ බෙර හඬ වරදක් නොඇසෙන සේ සුමට හඬක් ඇගේ සවනට වැකුණි. නොනවත්වාම අලංකෘතව වයා අවසානය සිත්කලු අන්දමට ඕ නිමා කළාය.

කෝෂය විඳ සමනලයා එළියට ආවේය. තවදුරටත් ඌ දළඹුවෙකු නොවේ. අද එලෙස කඩා දැමූ කෝෂය සමාජ මතයක් දුරලීමක් වැන්න. එය නව මානයක් පෙන්වීමකි.

## 03. මන්තරය

නිකවැවේ ගුරුන් ගෙයින් එළියට ගියේ දේවාල රාජකාරියට ය. කඩවර දෙයියන් හට පුද පූජා පවත්වා ශාන්තිකර්ම කරන්නා වූ සාම්ප්‍රදායික චතාවත් හෙතෙම තම සනුහරයෙන් දායාද කර ගත්තේ ය. කඩවර දෙයියන්ගේ ආශිර්වාදත් වරම් රැසකුත් ලද්දා වූ නිකවැවේ ගුරු වූ කලී තම ප්‍රිය බිරිඳගේ සෙනේහෙය අහිමිව ගිය හින්නි කුමාරිගේ ආරණීය අප්පොච්චිය. කුමාරිට අවුරුදු අට වස සපිරුණා පමණි. ගෙයි අත් උදව්වට වන් දයා සමඟ ඕ ගෙයි තනිකර හැන්දෑවෙල තෙක් දේවාල දේවකාරියේ නිකවැවේ ගුරුන් යෙදෙයි. යළි දිවා අහරට ගෙට වැදෙන නිකවැවේ ගුරුන් ගොම්මන් යාමේදී නැවත පැමිණෙයි.

සමනල අඩවිය කඳුකරයෙන් ඉර දෙයියෝ අහසට වඩිත්ම දේවාලේ දොර අරිනා නිකවැවේ ගුරුන් එදා මදක් පමා වී ගියේ පොහෝ දිනය නිසා ය. ඔහු සොයා එන ආතුරයන් එදිනට නැති තරම් ය. මේ අතර ගෙයි වූ හින්නිකුමාරි දයා නම් ගැහැණියකගේ ඇස්

මානයෙන් මිදී අප්පොච්චිගේ කාමරයට රිංගා ගත්තේ කුහුලිනි.

'' අප්පොච්චි වගේ මතුරන්ට ඇහැකි මටත්''

කියා හින්නිකුමාරි දඟකාරකමට ගුරුන්ගේ පොත් ඇවිස්සුවා ය. පෞරාණික භාණ්ඩ, තල්පත්, පුස්කොළපොත්, යන්තර, තෙල් කුප්පි ආදියෙන් කාමරය අනික් පැත්තට හැරවුණි. මකුළු විමානේ මකුළුවන්, වේයෝ හා නානාවිධ කෘමි සතුන් මේ කලබැගෑනිය මැද එළිපත්තට වී උන්නෝ ය. ඔවුනව නොතැකූ කුමාරි ඇද යට තිබූ පෙට්ටගමක් ඇද ගනිමින් එය විවර කළාය. කටු සිංහල අකුරින් ලියූ මන්තරයක් බ්‍රාහ්මී අක්ෂර ලියූ කොළ අතරින් ඈ සොයා ගත්තාය. එය ඇල්ලීමේ දී දෑත් ගැසෙන්නට වුයේ සිතේ වූ චකිතය හා බිය මුසු හැඟීම ගත පුරා විහිදෙද්දී ය. මුලු කොළය ම ගෙන දිගහැර බලා මුමුණමින් කීවේ ඕ හෙමින්ය. දෙවන වර මන්තරය හඬින් පැවසි කුමාරි නැවතත් එය ජප කළාය.

සුළඟ සැර විය සමනල කඳු පාමුල ගමක් වූ නිකවැවේ ගුරු හුන් ගමේ කවදටත් වඩා සැඩ මාරුතයක් එහෙ මෙහෙ වෙයි. රැහැයියන්ද අතොරක් නැතුව හඬ තලති. නිකවැවේ ගුරුන්ගේ ගෙයි අඳුරුය. හින්නිකුමාරි මන්ත්‍රය දොඩා ටික මොහොතකින් බියටම සිහි මූර්ජා වූ වනමය. නැගිටවත් නැත. දයා ද උදෑ පටන් කුමාරි සොයා අවසානයේ අවසර නොලත් කාමරයක් වූ නිකවැවේ ගුරුන්ගේ කාමරයට ගොසින් හින්නි කුමාරි ගෙනැවිත් ඇගේ කාමරයේ සතපවාලීය.

ඉර මුදුන් වූ යාමේත් සුළං සැරය. දූලි අවුස්සමින් සුළං පාරවල් ගස්වැල් මැදින් ඇදී ගොස්ය. ගුරුන් පැමිණ දෙතුන්වරක් මතුරත්ම කුමාරි සිහියට විත් යළිත් සිහි මූර්ජා විය. කෙදිනකවත් නිකවැවේ මන්තර වරදින් නැත . නමුත් මෙවර නම් එය වී හමාර බව ගුරුන්ටත් තේරුන් ගියෙන් රෑ එළිවනතුරු විවිධ පූජා තියා කුමාරි සුවපත් වේවා යැයි සිතුවේ ය. ගිරයට පෙති ගැසුණු දෙහි කැපිලි බිමට වැටුණි. හෙප්පුවේ බුලත් කොළ තෙල් කප්පි සිඳී ගොසිනි. කඩවර

දෙයියන්ගේ පහන දින ගණනක් ආලෝකමත්ව තිබිණි. ඒත් දේවාලයේ දොරටු වසා අගුලු ලාය.

ගෙවී ගිය සති දෙක තුනක කාලයේදී හින්නි කුමාරි වැටුණු තැනමය. කෑවේ බීවේ අවසිහියෙනි. මඳකින් නැගිටියි. මදක් සිහියෙන් හිඳියි. යළිත් ඇද වැටෙයි. පරිසරය ද වෙනස් ය. වසියි , නවතියි ,හෙණ පුපුරයි , ගස් අඹරා සුළං හමයි , ගුගුරයි , නැවත වස්ස පටන්ගනියි. හෝ ගා යයි. එකවරම හෙණ පුපුරමින් අකුණු රැන් රැන් එළි පෙන්වයි. නිකවැවේ ගුරුද තීරණයකට එළැඹියේය. තම ගුරුවරයා දැන් ගෙන්වාගත යුතුවැත.

'' උඹහැට මං හැම සිල්පෙම දුන්නා බාං, මේ කෙලීව සනීප කරගන්ඩ බැරි මොකෑ''

'' අනේ ගුරුන්නාන්සේ මං දන්න සිල්පෙන් උපරිමෙයිට කළා නොවැ''

'' මට පේනවා නිකවැවේ.... මං දන්න එකක් කොරලා

බලන්නම්, හිඳින්කෝ ආ... අරං වරෙං බුලත් කොළයි, තෙල් ඩිංගයි''

''හොඳමයි''

ලොකු ගුරුන්නාන්සේ හින්නි කුමාරිට මන්තරයක් කියා දන්නාකාරයින් සුවපත් කරන්නට මහත් වෑයමක් දැරුවේ ය. රෝග ලක්ෂණ එහෙත් නොවෙනස් ය.

'' ටික දොහක් බලමුකෝ...''

කියූ ලොකු ගුරුන්නාන්සේ තම ගෝල ගුරුන්ව අස්වසාලා එහිම රැඳුණේ ය. නිකවැවේ ගුරු පීතෘ ස්නේහය ළයෙහි හොවා හින්නි කුමාරි දෙස කඳුළු පිරි දෙනෙතින් බලා ගත්වනමය. ගෙයි උන් දයා මේ ටිකදාට පැමිණි ආතුර ජනකාය ගුරුන්නාන්සේ නැතැයි කියමින් හරවා යවා තිබුණි. ලොකු ගුරුන්නාන්සේත් සෙත් නොකළාම නොවේ. කඩවර දෙයියන්ගෙන් වරම් ඉල්ලා යාතිකා කළ හෙතෙම

තොවිල් ශාන්තිකර්මයකට ද අත ගැසුවේ ය. පොල් බිඳිමින් ගිනි පිඹිමින් ගොඩ මස් දියමස් බිලි පූජා කොට සුබ විහරණ ඉල්ලා බෙර ගසා හඬ නැඟුවේය. හින්නි කුමාරි නම් ආතුරව වැටුණු තැනමය.

මහා වරුසාව සැඩ කුණාටුවක් වී හමාරය. මල් ඉතා එල අස්වැන්න මේ වැසි දියෙන් පෙනෙන්නට නැත . අමාවකේ සැඟවුණ සඳට අහසත් අමතක වෙලාය. පෝ දින වන් ඉර ආකාසයේ උන් දා කෙදිනද නිනව්වක් නැත. ගස් වැල් අඹරා පිසගෙන හමනා සුළඟකද දිය කඳක් තව තවත් එති එතී එයි. කාලවර්ණ නබෝගැබක් මිහිකත දෙදරවාලීය. මිහිකත කෝපකරමින් වනලිය රිදූවා ගං ඇළ දොළ උතුරුවමින් සොබාදහම කම්පා කර සිහිල පමණක් ඉතුරු කර තිබුණි. මුලදී කෙළිලොල් සුළඟ මේඝයක්ව කුණාටුවකට වෙස් පෙරලා තිබේ.

''නිකවැවේ, කෙලීව ඉස්පරිතාලෙට ගෙනියමු''

වචනයකුදු නොකියා තම ගුරු අණට යටත් වූ

නිකවැවේ ගුරුන් හින්නි කුමාරිද කැටුව මහ රෝහල වෙත ගියේ ය.

නිකවැවේ දෙවොල අගුලලා වසා දමාය. කඩවර දෙයියන් කොහීදැයි කිව නොහැක. පිදූ මල් දම්, පඬුරු, පලතුරු වට්ටි දහසක් පරව මිලිනව එහිම ශේෂව ඇත. දෙවොල වටේ වල් පඳුරු දහසක් ඉපැද වැඩී තිබුණි. සමහරක් වැල් ගොස් දෙවාල බිත්ති නතු කොටගෙනය. දුර සිට බලන්නෙකුට එයින් දිස්වන්නේ කැලයක් පරිදිය. වහලද කොළ අතු ඩැහැගෙන මුලු දෙවොලම වනය විසින් අරක්ගෙන අගුලු ලා ගිය තැන සොයාගැනීමටවත් නොහැකි තරම්ය. දොවොල වනය තුළටම අභාවයට ගියේ කවුලු වලින් ඇතුළට පැමිණිය හැකි සතුන්ටත් නිවහනක් ඉඳිකර දෙමින් ය.

හින්නි කුමාරිගේ පරික්ෂා කිරීම් වලට පසුව ඇයව මානසික රෝග පිළිබඳ වෛද්‍ය මණ්ඩලයට යොමු කෙරුණි. එහි දී බිත්තිය තුළ සටහන් වූ වාක්‍යයක් නිකවැවේ ගුරුන් දුටුවේය.

'' යකැදුරාට පෙර වෙදැදුරා

හමුවන්න'' යි එහි විය.

## 04. දේදුන්නක්

'' බලංගොඩ ප්‍රදේශයේ එක්තරා ගමක...''

'' ඕ ශිට් කට් කට්''

අධ්‍යක්ෂකවරයා තරුණ නව නිවේදිකාවට කෑ ගසා විකාශනය කිරීමට ගත් වීඩියෝව රූපගත කිරීම එකවරම නවතා දැමුවේ ය.

'' බලන්න රේඛා කිසිම ශක්තිමත් ප්‍රාණවත් ගතියක් නෑනේ''

ඒ ඔහුගේ චෝදනාවය. රේඛා නම් නිවේදිකාව මයික්‍රෆෝනයෙන් නැවත නැවත හඬ පොවා ගන්නට ප්‍රයත්නයක් දැරූමුත් අවසන් නිවේදනය පමණක්ම සාර්ථක විය. නමුත් ඕ මැදිරියෙන් එළියට විත් නිවස බලා ගමන් අරඹුවේ තමා කෙතරම් උත්සහ දැරුවත් එයින් ඵලක් නොලද්දා යැයි යන පසුතැවීමෙනි.

ගිනි කාශ්ඨකයේ මඟ දිගට ඇවිද එත්ම හුළං රළක් විත් පිසගෙන යද්දී ඕ කෙහෙරැළි මුහුණින් ඈත් කරන්නට අත යැවූවද එයද නිෂ්ඵල විය. ඇවිද එන මගෙහි දිගටම වළවල් සහිත වූයෙන් අගල් එක හමාරක පමණ උසැති සපත්තු තවත් ඇයව වෙහෙස කරවිය. පාවහන් ගලවා දමා ආවේගයෙන්ම ඇවිද යත්ම අව්වට ගිනියම් තාර පොළොව දෙපා සීරි තුවාල කරවිය. කුඩයක්වත් අතැති නොවී මහ දවල් දාදියෙන් හෙම්බත්ව නිවසට පා නගන්නට වීම ඇව හිතින් මෙන්ම ගතින්ද දුර්වල කර දමා තිබුණි. රේඛා දරාගත්තේ කරන්නට යමක් නැතුවය.

මඟ දිගට ගසාගෙන එන රොබරෝසියා මල් දෙක තුනක් පරව ගොස්ය. මිලිනව ගිය මල්වලට යටින් ගැලවී වැටුණු පත්‍ර ද බොහෝය. සෙවණක්වත් හරිහැටි නැති මේ මාවත මඟක් දුෂ්කරය. හුළගට කැවටී ගොස් විසිරෙන වැලි කැට විත් කඳුලකට සරදම් කරයි. සෙවණැල්ලත් අයත් තනිව පැයකට පමණ පසු නිවසට ළඟා වීය.

''අක්කේ අද අව්වත් සැරයි, කෝ කුඩේ? කුඩේකුත් නැතුවද ආවේ?''

නිරුත්තර ව හුන් රේඛා තම කාමරයට වැද දොරද වසා ගමින් මඳක් නිහඬව හුදකලා විය. කාලයේ ගමන් මඟත් සමඟ පසුකර ගිය දවාල තුළ යළිත් ඇගේ නැඟණිය ඈ සොයාවිත් දොරට තට්ටු කළාය.

'' දවල්ට කෑම කන්න අක්කේ''

'' මං කෑවා''

රේඛා කීවේ එපමණය. කයෝර මහ දවාල ඇත්තෙන්ම ඇයට එපා වීමක් ගෙන ආවේ අධ්‍යක්ෂක තුමාගේ බැනුම් නිසාය. ඒ දහවලේ හිස පටන් දෙපතුළට කරව ගිය පරඬැලක් වන් ඇගේ ගත සිත යථාතත්වයේ ප්‍රාණකාරිත්වයට පත්වන්නට බොහෝ වේලාවක් ගත වුයේ හුදකලාවේ වාසයත් සමඟය.

දහවල් ගෙවී යත්ම සවස් යාමයේ ඇදහැලුණු මහා මොර සූරණ වැස්සත් විදුලි කෙටීමත් පරිසරය අඳුරෙන් ගිල ගත්තේ වැහි වතුර ජනෙල් පියන්වලට වදිද්දී ය. රේඛා කාමරයේ ජනේලය අසලට වී අතීතාවර්ජනයකය. වැස්සේ මහා ගර්ජනාව අභිභවා ඇගේ සිතට කා වැදි වාග් ප්‍රහාර සියල්ල දෝංකාර දෙන්නට විය. පුලුවන් උපරිමයෙන් සියලු දෑ දරා ගන්නට වෑයම් කළ රේඛා හිස් හැඟීමක් දරමින් සක්මන් කරන්නට පටන් ගත්තාය. මේ අතර තුරේදී දුරකථනය නාද විය.

'' හෙලෝ මේ රේඛා ද ''

''ඔව්''

'' මං ඩිරෙක්ටර් කතා කරන්නේ''

'' කියන්න සර්''

'' කණගාටුයි අපිට ඔයාව අයින් කරන්න වෙනවා, මොකද අද වුණ දෙයින්ම ඔයාට ඒක තේරෙන්න ඇති රයිට් තැන්ක් යූ''

'' හරි සර්''

වහිමින් පැවති ආකාශයේ විසල් හෙණ ගෙඩියක් පුපුරා ගියේ එසැණෙනි. ජනේලයේ යකඩ කූරු දෙදරවා ගොස් පොළොවද කම්පා කළ එයින් රේඛා ද ගතින් දෙදුරුම් කෑවේ ක්ෂණයකිනි. ඒ දෙදරා ගිය නිමේෂයෙන් පසු එළඹුණු නිහඬ බව අන්ධකාරයට පත්ව තනිය හා හුදකලාව තුළින් ශෝකය නම් නව නළු රසින් එකක් නවක නිවේදිකාවක තුළ පැන නැංගේ එවිටම නැඟි කඳුලු පටෙන් අවටත් තම සිහින ගොන්නත් එකවරම බොඳව යද්දීය.

ඇගේ කාමරයේ කෙමෙන් පිරුණු අඳුර රජවෙත්ම වීදුරු තුළින් දුටු අහසේ නිල් පැහැය නැතත් ගන කාල වර්ණය පමණක් ශේෂ කර හිස් බවක් පෙන්වීය. වහලේ හිල් අතරෙන් වැටෙන ජල බිංදු ඔහේ ගලාගෙන ගියේ අඳුරක දිලිසෙනු කෙලෙසැයි යන වගක් නැතුවය. මේ ගලනා වතුර නවතන රෙදි කඩ හා පනිට්ටු අද නොවීය. එහි වූ බිම කෙතරම් තෙත් වුවත්

අඳුර හා වර්ෂාවක නොනැවතුණු ඝෝෂාව එය සඟවා දමා තිබුණි. වැස්සත් ඝෝෂාවත් අන්ධාකරයත් නිර්මාණය කළේ හුදකලාවක පීඩිත මනස් ගර්භයක් පමණි.

සවස් යාමය උදා වූයේ කීයේ කණිසමට දැයි නොදත් රේඛා තම පරාජිත මාවතින් ඉවතට පැන දොර හැරගෙනවිත් රූපවාහිනිය ක්‍රියාත්මක කළේ වර්ෂාව නොතකා ය.

එහි විකාශනය වූයේ ඇවිදින් මැතක දී සාකච්ඡාවක් කළා වූ වැඩසටහනක් ය. ඇම පැවසි, එහි එක් වදනක් ඇගෙ සිතට කා වැදුණේ එවිටය.

''තෝමස් අල්වා එඩිසන් දහස් වතාවක් උත්සාහ නොකළා නම් අද අපට ආලෝකයක් තිබේවි ද?''

උත්සහය යළිත් එක් වතාවක් හෝ කුමකට හෝ උත්සාහ කර බලන්නට ඇත්නම් සිහිනයක් නොමැති වූවත් යළිත් කවර උත්සහයක් දරා හෝ සාර්ථක වන්නට ඇත්නම් ඇගේ සිත වාද කළේ

එලෙසිනි තමා පැවසූ වදන් තමාටම ගෙන ආවේ පසුතැවීමක් බව රේඛාට හැඟී ගියා ය. කාමරය දෙසින් නාද වූ දුරකථනයේ ඇමතුම තවත් නොදන්නා පුද්ගලයෙකුගෙන් වුවත් ඇමතුම ලබා ගත් ඇය තම හඬ අවදි කළාය.

''හෙලෝ''

''මේ රේඛා ද''

''ඔව්''

'' අපි පුවත්පත් වාර්තා සංගමයෙන් අපේ කෙනෙක් ඔයා ලියපු වාර්තාවක් වැරදිලා නාලිකාවේ ආයතනෙට ගියවෙලේ අරන් ඇවිත්. ඔයා හොඳ නිවේදිකාවක් නම් තමයි. ඒත් අකමැතිද අපේ පුවත්පත්වලට වාර්තා ලියා දෙන්න.''

කණාමැදිරි එළියක්විත් ජනේලය අසළ ගැවසී එහෙට මෙහෙට දැගලුවේ ය. අන්ධකාරය තුළින් එය ආලෝක රටාවක් මවාලී ය.

රේඛා විදුලි බුබුල දැල්වූවාය.

ගිලී තිබූ අන්ධකාරය පහව ගියේ ය.

වර්ෂාවද මඳින් මඳ පින්නකට පරිවර්තනය විය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

# සංධ්වනි

## කෙටි කතා සංග්‍රහය

"නිකවැවේ දෙවොල අගුලලා වසා දමාය. කඩවර දෙයියන් කොහීදැයි කිව නොහැක. පිදූ මල් දම්, පඬුරු, පලතුරු වට්ටි දහසක් පරව මිලිනව එහිම ශේෂව ඇත. දෙවොල වටේ වල් පඳුරු දහසක් ඉපැද වැඩී තිබුණි. සමහරක් වැල් ගොස් දෙවාල බිත්ති නතු කොටගෙනය. දුර සිට බලන්නෙකුට එයින් දිස්වන්නේ කැලයක් පරිදිය. වහලද කොළ අතු ඩැහැගෙන මුලු දෙවොලම වනය විසින් අරක්ගෙන අගුලු ලා ගිය තැන සොයාගැනීමටවත් නොහැකි තරම්ය. දොවොල වනය තුළටම අභාවයට ගියේ කවුලු වලින් ඇතුලට පැමිණිය හැකි සතුන්ටත් නිවහනක් ඉදිකරදෙමින්ය.

මන්තරය

නුවිනි හෙසාරා බටුකුමාර